# සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
# கூட்டுறவு அபிவிருத்தி திணைக்களம்
# DEPARTMENT OF CO-OPERATIVE DEVELOPMENT

දුරකථනය / தொலைபேசி / Telephone: 011-2478373, 011-2478374, 011-2478376

තැ.පෙ. 419, අංක 330, යුනියන් පෙදෙස, කොළඹ 02
த.பெ. இல. 419, இல. 330, யூனியன் பிளேஸ், கொழும்பு 02
P.O. Box 419, No. 330, Union Place, Colombo 02

ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2478386, 011-2478377

විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / e-mail: dcoopdev@sltnet.lk

වෙබ් අඩවිය / இணையத்தளம் / Web: www.coop.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: DCD/6/1/61

ඔබේ අංකය / உமது இல. / Your No.:

දිනය / திகதி / Date: 2020.02. 11

චක්‍රලේඛ අංක :03/2020 (නීති පොදු)

දීප ව්‍යාප්ත සමූපකාර සමිති හා සංගම් වල ගරු සභාපතිවරුන් වෙත,

## සමූපකාර සමිති නියෝජිතයින් විදේශ සංචාර සඳහා සහභාගී වීම

විදේශ සමුපකාර ආයතන වෙතින් මෙරට සමුපකාර ව්‍යාපාරයට පිරිනැමෙන ශිෂ්‍යත්ව, අධ්‍යයන සංචාර සඳහා නියෝජිතයින් සහභාගි කරවීමේදි, විධිමත් ආකාරයකට පුද්ගලයින් තෝරා නොගැනිම, සුදුසු පුද්ගලයින් සහභාගි නොකිරීම, සමුපකාර ව්‍යාපාරයෙන් පරිබාහිර පුද්ගලයින් සහභාගි කරවීම සහ සමුපකාර සමිතිවල අරමුදල් යොදවමින් විදේශ සංචාර සිදුකිරීමේදි සීමිත පිරිසකගේ වරප්‍රසාදයක් බවට එය පත්වී ඇති බවටත්, මෙම විදේශ අධ්‍යයන චාරිකා මඟින් ප්‍රතිලාභ සමුපකාර ව්‍යාපාරයට නොලැබෙන බවටත් චෝදනා එල්ලවන අතර එය සත්‍ය බව නිරික්ෂණය වේ.

2. එබැවින් සමුපකාර සමිතිවල අධ්‍යක්ෂවරුන්, මහසභා නියෝජිතයින්, සමාජිකයින් හෝ සේවකයින් විදේශ චාරිකා හෝ විදේශ ශිෂ්‍යත්ව සඳහා සහභාගි කරවිමේ දි එකී කාර්යය ක්‍රමවත්ව කිරීම සහ එකී චාරිකා වලදි ලබා ගන්නා දැනුම හා අත්දැකිම් සමුපකාර ව්‍යාපාරයේ සංවර්ධනය සඳහා යොදා ගැනීම අරමුණු කර ගනිමින් මෙම චක්‍ර ලේඛනය නිකුත් කරනු ලැබේ.

3. තවද සමුපකාර සමිති විසින් විදේශ ආයතන වෙතින් මෙරට සමුපකාර ව්‍යාපාරය වෙත පිරිනැමෙන ශිෂ්‍යත්ව අධ්‍යන චාරිකා හා රැස්වීම් සඳහා නියෝජිතයින් සහභාගි කරනුයේ අප රට නියෝජනය කරමින් වන බැවින් මින් ඉදිරියේදී ඒ සෑම නාමයෝජනාවක් සම්බන්ධයෙන්ම මාගේ අනුමැතිය ලබා ගත යුතු අතර පහත සඳහන් කරුණු කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

i. අධ්‍යක්ෂකවරුන්, මහසභා නියෝජිතයින්, සාමාජිකයින් සහ සේවකයින් විදේශ චාරිකා සඳහා සහභාගි කරවීමේදි ඒ සඳහා තෝරා ගන්නා ආකාරය පිළිබඳ නිර්ණායක සකස් කල යුතුය. එහි

    i. එක් අධ්‍යක්ෂකවරයකුට එක් නිලකාලයක් තුළදි සමිතියේ අරමුදල් යොදවා සහභාගි විය හැකි විදේශ සංචාර ගණන සහ තෝරා ගැනිමේ නිර්ණායක ඇතුලත් විය යුතුය.

    ii. මහසභා නියෝජිතයින් හා සමාජිකයින් විදේශ සංචාර සඳහා තෝරා ගැනිමේ නිර්ණායක ඇතුලත් විය යුතුය.

    iii. සමිතියේ සේවකයින් විදේශ සංචාර සඳහා තෝරා ගැනීමේ නිර්ණායක අඩංගු විය යුතුය.

iv. ඉහත නිර්ණායකයන් අධ්‍යක්ෂ මණ්ඩලයේ හා මහසභාවේ අනුමැතිය ලබාගෙන මාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර අනුමත කරගත යුතුයි.

II. i. සමිතියේ වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙහි විදේශ සංචාර / අධ්‍යයන චාරිකා සඳහා මූල්‍ය ප්‍රතිපාදන වෙන්කොට තිබිය යුතුය.

ii.විදේශ සංචාර සඳහා මුදල් යෙදවීමට ප්‍රමාණවත් කාරක ප්‍රාග්ධනයක් සමිතිය සතු විය යුතුය.

iii. සමිතිය පසුගිය දොලොස් මාසය තුළ ප්‍රමාණවත් ශුද්ධ ලාභයක් උපයා තිබිය යුතුය.

iV. සමිතිය රජයට, සමුපකාර අරමුදලට, සමුපකාර සමිතියකට හෝ වෙනත් භාහිර ආයතනයකට හෝ පුද්ගලයකුට ගෙවිය යුතු ණයක් හෝ වෙනත් යම් මුදලක් ගෙවීම පැහැර හැර නොතිබිය යුතුයි.

V.සමුපකාර සමිතියක නිසි පරිදි සමුපකාර සමිතියේ විධිවිධාන පරිදි අවම වශයෙන් පසුගිය දෙවර්ෂය තුළ වාර්ෂික ගිණුම් විගණන සඳහා ඉදිරිපත් කර තිබිය යුතුයි.

III. විදේශ සංචාර සිදු කිරීමේදී සමුපකාර ව්‍යාපාරය පිළිබඳ අධ්‍යයනය කිරීම හා අත්දැකීම් ලබා ගැනීමට හැකිවන පරිදි ඒවා සැලසුම් කල යුතු අතර, අදාල සංචාරයට සහභාගි වි මෙරටට පැමිණ මසක් ඇතුලත මෙම සංචාරය සම්බන්ධයෙන් එම චාරිකාව තුලින් තමා ලබාගත් අත්දැකීම්, තම සමුපකාර සමිතියේ හා මෙරට සමුපකාර ව්‍යාපාරයේ සංවර්ධනයට යොදා ගත හැකි ආකාරය පිළිබඳ වාර්තාවක් මා වෙත හා සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලබා දිය යුතුය.

එම වාර්තා පදනම් කර ගනිමින් තම ව්‍යාපාර කටයුතු සැලසුම් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමක් වන්නේය.. තවද තම විදේශ සංචාරයන් සම්බන්ධයෙන් නියමිත පරිදි වාර්තා ලබා නොදෙන කිසිවෙකුට ඉදිරියේදී විදේශ චාරිකා සඳහා සහභාගී වීමට අනුමැතිය ලබා නොදෙන බව අවධාරණය කරමි.

4. මේ අනුව විදේශ ශිෂ්‍යත්ව , අධ්‍යයන චාරිකා හා රැස්වීම් සඳහා සමුපකාර සමිති විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් , මහසභා නියෝජිතයින්, සාමාජිකයින් හා සේවකයින් යෝජනා කිරීමේදී සුදුසු අයවලුන් පමණක් යෝජනා කිරීම ඔබගේ වගකීමක් වේ.

5. විදේශ චාරිකා සඳහා මූල්‍ය වැය දැරීම සිදුකල යුත්තේ සහභාගී වන අය පිළිබඳව අනුමැතිය ලබා ගැනීමෙන් පසුවය. මුදල් වැය කිරීමෙන් පසු අනුමැතිය සඳහා මා වෙත යොමු කරන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා බලනු නොලබන බවත්, මාගේ පූර්ව අනුමැතිය නොමැතිව විදේශ සංචාර සඳහා දරනු ලබන සියළුම වියදම් වාර්ෂික විගණනයන් හිදී අධිභාර කිරීමකට යටත් කරනු ලබන බවද වැඩි දුරටත් අවධාරණය කරමි.විදේශ චාරිකා සඳහා වන පරිස්කාර හා දීමනා සම්බන්ධයෙන් උපදෙස් විටින් විට නිකුත් කරනු ලබන අතර ඒ අනුව දීමනා ගෙවීම සිදු කළ යුතුය.

විදේශ ශිෂ්‍යත්ව, අධ්‍යයන චාරිකා හා රැස්වීම් සඳහා නාම යෝජනා අනුමැතියට යොමු කිරීමේදී ඒ සමඟ පහත සඳහන් ලේඛනද මා වෙත ඉදිරිපත් කල යුතුය.

1. තෝරා ගැනීමේ පදනම
2. සංවර්ධන සැලැස්මේ හා අයවැය ඇස්තමේන්තුවේ උද්ධෘතය
3. මහ සභා වාර්තාවේ උද්ධෘතය
4. නාම යෝජනාව සම්බන්ධ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයේ උද්ධෘතය
5. තෝරාගත් අය මෙයට පෙර සමිතියේ වියදමින් විදේශගත වී ඇති වාර ගණන, දරන ලද වැය හා වාර්තා ලබා දී ඇති ද යන්න පිළිබඳ විස්තර
6. පසුගිය මාස 12ක කාලය සඳහා ලාභ අලාභ පිළිබඳ වාර්තාව
7. ඉල්ලීම් කරන දිනට කාරක ප්‍රාග්ධන ගිණුම
8. ගෙවීමට අපේක්ෂිත දීමනා පිළිබඳ වාර්තාවක්
9. සමිති අධීක්ෂණ නිලධාරියාගේ නිර්දේශය

සුවින්ද එස්. සිංගප්පුලි
සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ
සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්

පිටපත්

| | | |
|---|---|---|
| I. | සියළුම පලාත් ස.සං.කො.රෙ වරුන් | - කරු.දැ.ගැ.පි. |
| II. | ලේකම් - සමුපකාර සේවක කොමිෂන් සභාව | - කරු.දැ.ගැ.පි. |
| III. | සියළුම මාණ්ඩලික නිලධාරීන් | - කරු.දැ.ගැ.පි. හා අ.ක.ස |
| IV. | සියළුම ක්ෂේත්‍ර නිලධාරීන් | - කරු.දැ.ගැ.පි. හා අ.ක.ස |